ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

මගේ අංකය / எனது இல. / My No.
ඔබේ අංකය / உமது இல. / Your No.
දිනය / திகதி / Date 2026.04.02

පැමිණිලි පාර්ශවය : ඩබ්. ඒ. ලහිරු සම්පත් විජේතුංග මයා,
නො. 01, රජයේ නිවාස,
ඇත්නාවල,
වරකාපොල.

වගඋත්තර පාර්ශවය :

01. උප පොලිස් පරීක්ෂක කේ.පී.කේ. රණවංශ මයා,
ස්ථානාධිපති (දූෂණ මර්දන අංශය)
පොලිස් ස්ථානය,
වරකාපොල.

02. පොලිස් සැරයන් 53529 ඒ.කේ. කලුආරච්චි මයා,
පොලිස් ස්ථානය,
කෙසෙල්වත්ත .

03. ප්‍රධාන පොලිස් පරීක්ෂක එස්.ජී.ඒ.ආර්.එල්. සේනාධීර මයා,
වරකාපොල පොලිස් ස්ථානය, (හිටපු ස්ථානාධිපති)
පොලිස් අධිකාරී කාර්යාලය,
ගම්පහ. (වර්තමාන සේවා ස්ථානය)

**<u>පැමිණිලි අංකය : HRC/HO/2478/22</u>**

**පැමිණිල්ලේ කරුණු දැක්වීම :**

උක්ත පැමිණිලිකරු විසින් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත 2022.07.21 දිනැතිව පහත පරිදි පැමිණිල්ලක් ගොනුකර ඇත. තමා 2022.05.25 වන දින තමාගේ සිල්ලර වෙළඳසැලට පැමිණ වෙළඳාම් කටයුතුවල නිරතවී සිටි බවත්, පෙ.ව. 9.00 – 10.00 පමණ වරකාපොල පොලිස් ස්ථානයේ නිල් පැහැති ත්‍රීරෝද රථය තමාගේ වෙළඳසැල ඉදිරියේ ඇති කොළඹ - නුවර ප්‍රධාන මාර්ගයේ දංඕවිට දෙසට ගමන් කරනු තමා දුටු බවත් ප්‍රකාශ කර ඇත. මඳ වේලාවකට පසු නැවතත් එම පොලිස් ත්‍රීරෝද රථය තමාගේ වෙළඳසැල ඉදිරිපිට මාර්ගය අයිනේ නතර කොට උප පොලිස් පරීක්ෂක රණවංශ මහතා, පොලිස් සැරයන් 53529 කලුආරච්චි මහතා සහ තවත් නිලධාරියෙක් තමාගේ වෙළඳසැල වෙත පැමිණි බවත්, උප පොලිස් පරීක්ෂක රණවංශ මහතා විසින් 119 අංකයට ලැබුණු පැමිණිල්ලක්

ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office: අංක 14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ 04. / இல. 14, ஆர். ஏ. த. மெல் மாவத்தை, கொழும்பு 04. / No. 14, R. A. De Mel Mawatha, Colombo 04.
සභාපති / தவிசாளர் / Chairman: 011 - 250 5451
ෆැක්ස් / தொலைநகல் / Fax: 011 - 250 5541/74
ඊමේල් / மின்னஞ்சல் / E-mail: sechrcsl@gmail.com
දුරකථනය / தொலைபேசி / Telephone: 94-11-2505580 / 81 / 82
ලේකම් / செயலாளர் / Secretary: 011 - 250 5521
ක්ෂණික / துரித அழைப்பு / Hotline: 1996
වෙබ් / இணையம் / Web: www.hrcsl.lk

සම්බන්ධයෙන් සෝදිසි කිරීමට පැමිණි බව ප්‍රකාශ කළ බව සඳහන් කර ඇත. පසුව එම නිලධාරීන් විසින් තමාගේ ත්‍රීරෝද රථය පරික්ෂා කළ බවත් එහිදී රථයේ පිටුපස අසුනේ වම් පස පැති ආවරණ තුළ තිබී සුදු පැහැති ග්‍රොසරි කවරයක ඔතන ලද සිගරට් පැකට්ටුවක් එළියට ගත් බවත් එය විවෘත කර, එහි තිබී රතු පාට සිලිකවර කැබලි වල ඔතන ලද කුඩා පාර්සල් කිහිපයක් පොලිස් සැරයන් 53529 කලුආරච්චි නිලධාරියා විසින් එළියට ගත් බවත් එම නිලධාරියා විසින් ඒවා උප පොලිස් පරීක්ෂක රණවංශ නිලධාරියාට ලබාදුන් පසු උප පොලිස් පරීක්ෂක රණවංශ නිලධාරියා විසින් "මේ තියෙන්නේ බඩු" යැයි පැවසූ බවත්, තමා විසින් ඒවා තමාගේ නොවන බවත් ඒ පිළිබඳව තමා කිසිවක් නොදන්නා බව එම නිලධාරීන්ට ප්‍රකාශ කළ බවත් සඳහන් කර ඇත. එහෙත් එම නිලධාරීන් තමා ප්‍රකාශ කළ කිසිවක් පිළිනොගෙන තමා හා ත්‍රීරෝද රථය අත්අඩංගුවට ගත් බව සඳහන් කර ඇත. පසුව තමා විසින් තම බිරිඳට දුරකථන ඇමතුමක් ලබාදුන් පසු බිරිඳ ද එම ස්ථානයට පැමිණ පොලිස් නිලධාරීන්ට මේ පිළිබඳව පැහැදිලි කළ ද එම නිලධාරීන් ඒ කිසිවක් පිළිගැනීමට අකමැතිවූ බවත් සඳහන් කර ඇත. පසුව තමා හා තම බිරිඳ තමාගේ ත්‍රීරෝද රථයෙන් උප පොලිස් පරීක්ෂක රණවංශ නිලධාරියා සමඟ වරකාපොළ පොලිස් ස්ථානයට පැමිණි බවත් තමා සහ බිරිඳ පොලිස් ස්ථානයේ අපරාධ අංශයට රැගෙන ගිය පසු කලුආරච්චි නිලධාරියා විසින් පාර්සල්වල තිබූ පවුඩර් වර්ගයක් A4 කොළයක් මතට දමා, එය පිරිසිදු හෙරොයින් බවට පොලිස් සැරයන්53529 කලුආරච්චි නිලධාරියා ප්‍රකාශ කළ බවත් සඳහන් කර ඇත.

පසුව එම නිලධාරීන් දෙදෙනා තමා සහ බිරිඳ රැගෙන වරකාපොළ පොලිස් ස්ථානය ඉදිරිපිට ඇති ස්වර්ණමහල් වෙළඳසැලට ගොස් එම කුඩු වර්ගය කිරා බලා මිලිග්‍රෑම් 2300 ක් බවට ප්‍රකාශ කර නැවත පොලිස් ස්ථානයට පැමිණි බව සඳහන් කර ඇත. එම අවස්ථාවේදී එම ස්ථානයට පැමිණි තමා පුද්ගලිකව හඳුනනු ලබන එම පොලිස් ස්ථානයේම සේවය කරනු ලබන කුමාර නැමති නිලධාරියා විසින් තමා එවැනි වරදක් නොකරන පුද්ගලයෙකු බව උප පොලිස් පරීක්ෂක රණවංශ නිලධාරියාට ප්‍රකාශ බව සඳහන් කර ඇත. එව අවස්ථාවේදී කලුආරච්චි නිලධාරියා විසින් "නෑ කිවුවට මේ අහුවෙලා තියෙන්නේ සුපිරි බඩු, මෙච්චර හොඳ බඩු ටිකක් මම කවදාවත් අල්ලලා නැහැ" යනුවෙන් පැවසූ බවත් සඳහන් කර ඇත. එදින තමා සිරමැදිරියට දැමූ බවත් උප පොලිස් පරීක්ෂක රණවංශ නිලධාරියා විසින් තමාට අධිකරණයෙන් ඇප ලබාගත හැකි බව ප්‍රකාශ කළ බවත් ප්‍රකාශ කර ඇත. 2022.05.26 දින තමා වරකාපොළ මහෙස්ත්‍රාත් අධිකරණයට යොමුකිරීමෙන් අනතුරුව රස පරීක්ෂක වාර්තාව ලැබෙන තෙක් තමා රක්ෂිත බන්ධනාගාර ගත කළ බවත් ප්‍රකාශ කර ඇත. 2022.10.12 දින රස පරීක්ෂක වාර්තාව අධිකරණය වෙත ඉදිරිපත් කිරීමෙන් අනතුරුව තමාට ඇප ලබාදුන් බවත් සඳහන් කර ඇත. එම රස පරීක්ෂක වාර්තාව අනුව තමාගේ ත්‍රීරෝද රථයේ තිබී හමුවූ පාර්සලයේ තිබූ පවුඩර් වර්ගය තුළ කිසිදු මත්ද්‍රව්‍ය වර්ගයක් නොමැති බවට තහවුරුවී තිබූ බවත් මෙම නිලධාරීන්ගේ ක්‍රියාකලාපය හේතුවෙන් තමාට තමා මාස 04 යි දින 28 ක පමණ කාලයක් රක්ෂිත බන්ධනාගාර ගතවී නොකළ වරදක් වෙනුවෙන් දඬුවම් විඳීමට සිදුවීම, තම ව්‍යාපාර කටයුතු විනාශවීම, තමාට සමාජ අපහාසයට ලක්වීමට සිදුවීම හේතුවෙන් විශාල අගතියක් අසාධාරණයකට පත්වීමට සිදුවූ බැවින් කොමිෂන් සභාව විසින් සාධාරණයක් ඉටුකර දෙන මෙන් වැඩිදුරටත් ඉල්ලා ඇත.

**වගඋත්තර පාර්ශවයේ කරුණු දැක්වීම :-**

මෙම පැමිණිල්ල ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේදී 2024.04.24 දින විභාගයට ගන්නා ලද අතර එදින පැමිණිල්ල විභාගය සඳහා සහභාගී වූ උප පොලිස් පරීක්ෂක කේ. පී. කේ. රණවංශ මහතා පහත පරිදි ප්‍රකාශයක් ලබාදෙන ලදි.

**පළමුවන වගඋත්තරකරු - උප පොලිස් පරීක්ෂක කේ.පී.කේ. රණවංශ මයා - ස්ථානාධිපති (දූෂණ මර්දන අංශය)**

2022.05.25 වන දින තමා ස්ථානාධිපතිතුමාගේ නියෝග පරිදි දිවා ජංගම සංචාරයේ යෙදී සිටි බවත් තමා සමඟ පොලිස් සැරයන් 53529 කලුආරච්චි නිලධාරියා ශාරීරික අභ්‍යාස ඇඳුමින් ද, පොලිස් සැරයන් රියදුරු 34668 ලියනගේ නිලධාරියා නිල ඇඳුමින් ද සැරසී වරකාපොල පොලිස් ස්ථානයට අයත් WP ABV 1916 දරණ ත්‍රීවිල් රථයෙන් සංචාරයේ යෙදී සිටි බවත් ප්‍රකාශ කර ඇත. තමා ඇතුළු පිරිස මීරිගම හන්දියේ ත්‍රීරෝද රථයෙන් සංචාරයේ යෙදීසිටින අතරතුර වරකාපොල පොලිස් ස්ථානයේ ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරීක්ෂක සේනාධීර මහතා විසින් පෙ.ව. 11.45 ට පමණ දුරකථන ඇමතුමක් ලබාදී දුම්මලදෙණිය මිෂාන් වෙළඳසැල අසල SG AAI 1414 ත්‍රීවිල් රථයෙන් ලහිරු යන අය මත්කුඩු තබාගෙන අලෙවිකරන බව දැනුම්දුන් බවත්, එකී තොරතුර අනුව තමා සමග නිලධාරීන් දැනුවත් කර එම ස්ථානයට ගිය බව ප්‍රකාශ කර ඇත. අදාළ වෙළඳසැලට යාබදව ඉහත අංක දරණ ත්‍රීරෝද රථය නතර කර තිබූ බවත් ත්‍රීරෝද රථය කර්ටන් දමා වසා තිබූ බවත් සඳහන් කර ඇත. පසුව වෙළඳසැල අසලට ගොස් මෙම ත්‍රීරෝද රථයේ මත්ද්‍රව්‍ය සඟවා ඇති බවට තොරතුරක් ලද බැවින් පරීක්ෂා කිරීමට පැමිණි බව පැමිණිලිකරුට දැන්වූ බවත් ඔහු කිසිදු විරෝධතාවයක් නොපෙන්වූ බවත් ප්‍රකාශ කර ඇත. අදාළ ත්‍රීරෝද රථය පරීක්ෂා කරන අවස්ථාවේදී පැමිණිලිකරු විසින් තමාට "මේක වෙන ප්‍රශ්නයක්. පසුගිය දිනවල සිදුවූ අරගල වලින් පසු ඇතිවූ දෙයක් තමයි මේ දිගින් දිගටම එන්නේ" යනුවෙන් පැවසූ බවත් සඳහන් කර ඇත. තමාගේ නියෝග පරිදි පොලිස් සැරයන් 53529 කලුආරච්චි නිලධාරියා විසින් ත්‍රීරෝද රථය පරීක්ෂා කළ බවත් ත්‍රීරෝද රථයේ පැති ආවරණයේ සඟවා තිබූ සිගරට් පැකැට්ටුවක් ඉවතට ගත් බවත් ඒ තුළ රෝස පැහැති ෂොපින් කවරවල ඔතන ලද කුඩා පාර්සල් කිහිපයක් තිබී සොයාගත් බවත් ප්‍රකාශ කර ඇත. එම කුඩා පාර්සල් ප්‍රමාණය ගණන් කළ පසු එහි පැකට් 43 ක් තිබූ බවත් මෙම පැකට් ත්‍රීරෝද රථයේ පැති ආවරණ අතර සඟවා තිබූ ආකාරයෙන් සහ හෙරොයින් මත්ද්‍රව්‍ය පාර්සල් කරන ආකාරයෙන් පාර්සල් කර තිබූ බැවින් ඉන් එක් පැකැට්ටුවක් විවෘත කර පරීක්ෂා කළ බවත් ප්‍රකාශ කර ඇත. තමාට සහ පොලිස් සැරයන්53529 කලුආරච්චි නිලධාරියාට මත්ද්‍රව්‍ය වැටලීම්කර ලබාගත් දැනුම අනුව එම පවුඩර් වර්ගයෙහි වර්ණය සහ පාර්සල් කර තිබූ ආකාරය අනුව ඒවා හෙරොයින් බවට නිරීක්ෂණය වූ බැවින් තවදුරටත් ත්‍රීරෝද රථය පරීක්ෂා කළ ද වෙනත් කිසිවක් හමුනොවූ බැවින් පැමිණිලිකරුට වරද කියාදී අත්අඩංගුවට ගත් බව ප්‍රකාශ කර ඇත.

එම අවස්ථාවේදී පැමිණිලිකරු විසින් සිය බිරිඳට දුරකථන ඇමතුමක් ලබාගත යුතු බව ප්‍රකාශ කළ බවත් පැමිණිලිකරුගේ බිරිඳ පැමිණි පසු වෙළඳසැලේ යතුරු භාරදී පැමිණිලිකරු රැගෙන ත්‍රීරෝද රථයද සමග වරකාපොළ පොලිස් ස්ථානය ආසන්නයේ තිබූ ස්වර්ණ මහල් ආයතනයට ගොස් අත්අඩංගුවට ගන්නා ලද නඩු බඩු කිරා බැලූ බවත් එහිදී මිලිග්‍රෑම් 2300 ක් පමණ තිබූ බවත් සඳහන් කර ඇත. පසුව නඩු බඩු සහ සැකකරු පොලිස් ස්ථානයට ඉදිරිපත් කළ බව ප්‍රකාශ කර ඇත.

**දෙවන වගඋත්තරකරු - පොලිස් සැරයන් 53529 ඒ.කේ. කලුආරච්චි මහතා**

2022.05.25 දින උප පොලිස් පරීක්ෂක රණවංශ මහතා සමඟ තමා දිවා ජංගම රාජකාරි කටයුතු නිරතවී සිටි බවත් එම අවස්ථාවේදී උප පොලිස් පරීක්ෂක රණවංශ මහතාට වරකාපොල පොලිස් ස්ථානයේ ස්ථානාධිපතිතුමා විසින් දුරකථන ඇමතුමක් ලබාදී දූම්මලදෙණිය හන්දිය අසල දකුණු පස පිහිටි වෙළඳසැලක් ඉදිරිපිට නතර කර ඇති ත්‍රීරෝද රථයක නීතිවිරෝධී මත්ද්‍රව්‍ය ඇති බවට තොරතුරක් ලැබුණු බව දැන්වූ බව ප්‍රකාශ කර ඇත. ඒ අනුව තමා ඉහත නිලධාරියා සමඟ අදාළ ස්ථානයට ගිය බවත් තොරතුර අනුව අදාළ වෙළඳසැලෙහි අයිතිකරුවෙතින් ඒ ආසනන්යේ නතර කර තිබූ ත්‍රීරෝද රථයෙහි අයිතිකරු කවුරුන්ද යන්න විමසා සිටි බවත් එවිට පැමිණිකරු විසින් එය තමාගේ බව පැවසූ පසු ත්‍රීරෝද රථය අසලට පැමිණිලිකරු ද කැඳවා උප පොලිස් පරීක්ෂක රණවංශ මහතා ඉදිරිපිටදී තමා විසින් ත්‍රීරෝද රථය පරීක්ෂා කළ බවත් සඳහන් කර ඇත. එම අවස්ථාවේදී එම ත්‍රීරෝද රථයේ පිටුපස අසුනේ වම් පස ඇති කැනපි රෙද්දට ඇතුල් පැත්තේ වම් පස බෝඩ් එක අතර තිබී හමුවූ සිගරට් පැකැට්ටුවක් පරීක්ෂා කිරීමේදී ඒ තුළ හෙරොයින් පැකට් වලට සමාන ආකාරයේ පැකට් 43 ක් හමුවූ බවත් ප්‍රකාශ කර ඇත. තවද තමා හෙරොයින් සම්බන්ධ වැටලීම් රාශියක් සිදුකර ඇති බවත් මෙම පැකට්වල අඩංගු ද්‍රව්‍ය හෙරොයින් වලට අතිශයින් සමානව තැබූ බැවින් ඒවා හෙරොයින් බවට තහවුරු කරගත් බව වැඩිදුරටත් ප්‍රකාශ කර ඇත. පසුව උප පොලිස් පරීක්ෂක රණවංශ මහතා විසින් සැකකරුට වරද කියාදී අත්අඩංගුවට ගත් බවත් පැමිණිලිකරු වරකාපොළ පොලිස් ස්ථානයට ආසන්නයේ පිහිටි ස්වර්ණ මහල් ආයතනය වෙත රැගෙන ගොස් අදාළ නඩු බඩු කිරා බලා පොලිස් ස්ථානයට ඉදිරිපත් කළ බවත් ප්‍රකාශ කර ඇත.

**තෙවන වගඋත්තරකරු - ප්‍රධාන පොලිස් පරීක්ෂක එස්.ජී.ඒ.ආර්.එල්. සේනාධීර මයා ස්ථානාධිපති (හිටපු), වරකාපොළ පොලිස් ස්ථානය**

ඉහත වගඋත්තර පාර්ශවය 2025.06.27 වන දින කොමිෂන් සභාවේදී පවත්වන ලද පැමිණිල්ල විභාගයට සහභාගීවී පහත ප්‍රකාශය ලබාදී ඇත. 2022.05.25 වන දින වරකාපොළ පොලිස් ස්ථානයට පොලිස් මූලස්ථානයේ 119 ක්ෂණික ඇමතුම් ඒකකය මගින් පණිවිඩයක් ලබාදී තිබූ බවත්, එකී පණිවිඩයෙහි තමාට මතක ආකාරයට දූම්මලදෙණිය ප්‍රදේශයේ මත්ද්‍රව්‍ය ලග තබාගැනීමක් සම්බන්ධයෙන් බවත් ප්‍රකාශ කර ඇත. එම පණිවිඩය අප පොලිස් ස්ථානයේ 119 ක්ෂණික ඇමතුම් දුරකථන ලේඛනයෙහි සටහන් කර දුරකථන ක්‍රියාකාරු විසින් 119 පැමිණිලි පිළිබඳ විමර්ශනය සඳහා එදින යොදවා සිටි උප පොලිස් පරීක්ෂක රණවංශ නිලධාරියා ඇතුළු නිලධාරීන්ට ලබාදී තිබූ බවත්

සඳහන් කර තිබේ. ඒ අනුව උප පොලිස් පරීක්ෂක රණවංශ නිලධාරියා ඇතුළු නිලධාරීන් අදාළ ස්ථානය වැටලීම් කර මත්කුඩු ලග තබාගැනීම සම්බන්ධව සැකපිට අත්අඩංගුවට ගත් පුද්ගලයෙකු නඩු බඩු ද සමග පොලිස් ස්ථානයට ඉදිරිපත් කර තිබූ බවත්, සැකකරු අත්අඩංගුවට ගැනීම සම්බන්ධයෙන් අදාළ නිරීක්ෂණ සටහන් තොරතුරු සටහන් පොත්වල ඇතුළත් කර තිබූ බවත් ප්‍රකාශ කර ඇත. එසේ තොරතුරු සටහන් පොත්වල ඇතුළත් කරන ලද තොරතුරුවලට අනුව ප්‍රධාන පොලිස් පරීක්ෂක ඒ. ඩී. සී. ප්‍රසාද් නිලධාරියා විසින් එම සැකකරු වරකාපොළ මහෙස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කිරීමට කටයුතු කර ඇති බවත් ප්‍රකාශ කර ඇත. සැකකරු අධිකරණයට ඉදිරිපත් කළ පසු අධිකරණ නියෝග මත රක්ෂිත බන්ධනාගාර ගත කර ඇති අතර, වරකාපොළ පොලිස් ස්ථානයේ පොලිස් පරීක්ෂක අබේරත්න නිලධාරියා විසින් මෙම සැකකරු සම්බන්ධයෙන් වැඩිදුර විමර්ශනය කර ලබාදුන් තොරතුරු අනුව තමා විසින් 2022.06.09 වන දින ගරු අධිකරණයට වැඩිදුර වාර්තාවක් යොමුකළ බවත් ප්‍රකාශ කර ඇත. මෙම සැකකරු සන්තකයේ තිබූ විමර්ශන නිලධාරීන් විසින් අත්අඩංගුවට ගනු ලැබූ මත්කුඩු පරීක්ෂා කිරීම සඳහා ගරු අධිකරණයේ නියෝග මත රජයේ රස පරීක්ෂකතුමා වෙත යොමුකර ඇති බවත්, එම වාර්තාව අනුව මෙම නඩු භාණ්ඩ මත්කුඩු නොවන බවය වාර්තාව ලැබීමෙන් පසු ගරු අධිකරණය සැකකරු නිදහස් කර ඇති බවත් ප්‍රකාශ කර ඇත. තවද තමා 2022.01.30 දින සිට 2022.07.29 දින දක්වා වරකාපොළ පොලිස් ස්ථානයේ ස්ථානාධිපති ලෙස සේවය කළ බවත්, 2022.07.29 වන දින ස්ථාන මාරුවීම් ලබා තෙල්දෙණිය මූලස්ථාන පොලිස් පරීක්ෂක ලෙස රාජකාරී වාර්තා කළ බවත් සඳහන් කර ඇත.

**නිරීක්ෂණ :**

- 2022.05.25 වන දින පැමිණිලිකරු අත්අඩංගුවට ගැනීම සම්බන්ධයෙන් පළමු වගඋත්තරකරුවන උප පොලිස් පරීක්ෂක කේ. පී. කේ. රණවංශ නිලධාරියා ප්‍රකාශ කර ඇත්තේ, "තමා ඇතුළු නිලධාරීන් පිරිස මීරිගම හන්දියේ ත්‍රීරෝද රථයෙන් සංචාරයේ යෙදීසිටින අතරතුර වරකාපොල පොලිස් ස්ථානයේ ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරීක්ෂක සේනාධීර මහතා විසින් පෙ.ව. 11.45 ට පමණ දුරකථන ඇමතුමක් ලබාදී, දුම්මලදෙණිය මිහාන් වෙළඳසැල අසල SG AAI 1414 ත්‍රීවිල් රථයෙන් ලහිරු යන අය මත්කුඩු තබාගෙන අලෙවිකරන බව දැනුම්දුන් බවත්, එකී තොරතුර අනුව තමා සමග සිටි නිලධාරීන් සමග එම ස්ථානයට ගොස් ඉහත අංක දරණ ත්‍රීරෝද රථය පරීක්ෂා කළ බවත්, එම අවස්ථාවේදී ත්‍රීරෝද රථයේ සඟවා තිබූ හෙරොයින් මත්ද්‍රව්‍ය හමුවූ බවත්"ය.

- මේ සම්බන්ධයෙන් උප පොලිස් පරීක්ෂක කේ. පී. කේ. රණවංශ නිලධාරියා සමග එදින වැටලීම් රාජකාරී සඳහා පිටත්ව ගිය දෙවන වගඋත්තරකරුවන පොලිස් සැරයන් 53529 ඒ. කේ. කලුආරච්චි නිලධාරියාගෙන් විමසීමේදී ප්‍රකාශ කර ඇත්තේ ද "දිවා ජංගම රාජකාරී කටයුතුවල නිරතවී සිටින අතරතුර උප පොලිස් පරීක්ෂක රණවංශ මහතාට වරකාපොල පොලිස් ස්ථානයේ ස්ථානාධිපතිතුමා විසින් දුරකථන ඇමතුමක් ලබාදී, දුම්මලදෙණිය හන්දිය අසල දකුණු පස පිහිටි

වෙළඳසැලක් ඉදිරිපිට නතර කර ඇති ත්‍රීරෝද රථයක නීතිවිරෝධී මත්ද්‍රව්‍ය ඇති බවට තොරතුරක් ලැබුණු බව දැන්වූ බවයි". එහෙත් තෙවන වගඋත්තරකරුවන ප්‍රධාන පොලිස් පරීක්ෂක එස්. ජී. ඒ. ආර්. එල්. සේනාධීර මයා ස්ථානාධිපති (හිටපු) වෙතින් මේ පිළිබඳ විමසීමේදී ප්‍රකාශ කර ඇත්තේ, "තමා එවැනි පණිවිඩයක් උප පොලිස් පරීක්ෂක රණවංශ නිලධාරියාට ලබාදුන්නා ද යන්න මතක නොමැති බවත්, 2022.05.25 වන දින වරකාපොළ පොලිස් ස්ථානයට පොලිස් මූලස්ථානයේ 119 ක්ෂණික ඇමතුම් ඒකකය මගින් දුම්මලදෙණිය ප්‍රදේශයේ මත්ද්‍රව්‍ය ලග තබාගැනීමක් සම්බන්ධයෙන් පණිවිඩයක් ලබාදී තිබූ බව පමණක් මතක බවත්"ය.

- ඉහත වගඋත්තරකරුවන්ගේ ප්‍රකාශවල පරස්පතාවයක් පවතින බව නිරීක්ෂණය වූ බැවින්, මෙම පැමිණිලිකරු සම්බන්ධයෙන් පොලිස් මූලස්ථානයේ 119 ක්ෂණික ඇමතුම් ඒකකය මගින් වරකාපොළ පොලිස් ස්ථානය වෙත 2022.05.25 වන දින පැමිණිලිකරුගේ ත්‍රීරෝද රථයේ හෙරොයින් මත්ද්‍රව්‍ය සගවා ඇති බවට තොරතුරක් ලැබී තිබුනේද යන්න සම්බන්ධයෙන් වාර්තාවක් කැඳවන ලදි. ඒ අනුව 2026.02.10 දිනැතිව වරකාපොල පොලිස් ස්ථානය වෙතින් කොමිෂන් සභාව වෙත 119 ක්ෂණික ඇමතුම් ඒකකය මගින් යොමුකරනු ලබන පැමිණිලි සටහන් කරගන්නා ලද පොතෙහි සහතික පිටපතක් යොමුකර ඇති අතර, එකී පණිවිඩ සටහන් විමර්ශනය කිරීමේදී 2022.05.21 වන දින පැය 14.29 ට "දුම්මලදෙණිය හන්දියේ මිෂාන් කඩය අසල නවතා ඇති SP AAI 1414 ත්‍රීරෝද රථයේ ලහිරු යන අය පිටුපස අසුනේ මත්කුඩු සගවා ඇති බව" යනුවෙන් පණිවිඩයක් සටහන්වී ඇති බව නිරීක්ෂණය විය.

- ඒ අනුව එකී පණිවිඩය වරකාපොළ පොලිස් ස්ථානය වෙත ඉහත පරිදි 119 ක්ෂණික ඇමතුම් ඒකකය මගින් ලැබී ඇත්තේ, 2022.05.21 වන දින පැය 14.29 වන නමුත්, එදින අදාළ ත්‍රීරෝද රථය පරීක්ෂා කිරීමක් සිදුකර නොමැත. උප පොලිස් පරීක්ෂක කේ. පී. කේ. රණවංශ නිලධාරියා සහ පොලිස් සැරයන් 53529 ඒ.කේ. කලුආරච්චි නිලධාරියා ප්‍රකාශ කරන ආකාරයට, හිටපු ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරීක්ෂක එස්. ජී. ඒ. ආර්. එල්. සේනාධීර මහතා විසින් පැමිණිලිකරුගේ ත්‍රීරෝද රථයේ මත්ද්‍රව්‍ය සගවා ඇති බවට පණිවිඩයක් ලද බව දුරකථනයෙන් දැනුම්දී ඇත්තේ, 2022.05.25 වන දින පෙ.ව. 11.45 පමණ වේ. එකී පණිවිඩයට අනුව පැමිණිලිකරු අත්අඩංගුවට ගැනීම සිදුකර ඇත්තේ 2022.05.25 වන දින පැය 12.20 වේ. ඒ අනුව මත්ද්‍රව්‍ය සගවා ඇති බවට අදාළ තොරතුර 2025.05.21 වන දින පැය 14.29 ට ලැබුණේ නම්, එදින සිට දින පහකට ආසන්න කාලයක් ගතවන තෙක් අදාළ ත්‍රීරෝද රථය සෝදිසි කිරීමක් සිදුකර නොතිබීම ගැටලු සහගත වේ.

- ඒ අනුව පැමිණිලිකරු අත්අඩංගුවට ගැනීම සඳහා අදාළ පණිවිඩය ලැබීම සම්බන්ධයෙන් වගඋත්තර පාර්ශවයන් විසින් ලබාදී ඇති ප්‍රකාශ සහ වරකාපොළ පොලිස් ස්ථානයේ දූෂණ මර්දන තොරතුරු සටහන් පොත්වල යොදා ඇති සටහන්, දුරකථන පණිවිඩ වාර්තා පොතේ යොදා ඇති සටහන් සියල්ල විමර්ශනය කිරීමේදී, අදාළ ප්‍රකාශ සහ සටහන් පරස්පරවිරෝධී බව නිරීක්ෂණය

වේ. තවද, මත්ද්‍රව්‍ය සන්තකයේ පවතින බවට නිශ්චිතනම තොරතුරක් ලැබී තිබියදී, පණිවිඩය ලද දිනම ක්ෂණිකව ක්‍රියාත්මක නොවී දින පහකට ආසන්න කාලයක් ගතවන තෙක් සිටීම ද ගැටලු සහගත වේ.

- වරකාපොල ම/උ බී 285/2022 දරණ නඩු වාර්තාවේ දක්වා ඇති පරිදි, පැමිණිලිකරු 2022.05.25 වන දින වරකාපොල පොලිස් ස්ථානය විසින් හෙරොයින් මිලිග්‍රෑම් 2300 සන්තකයේ තිබූ බවට සැකපිට අත්අඩංගුවට ගෙන 2022.05.26 වන දින වරකාපොල ගරු මහේස්ත්‍රාත් අධිකරණය වෙත ඉදිරිපත් කර ඇති අතර, උක්ත දක්වන ලද මත්ද්‍රව්‍ය ප්‍රමාණය අනුව ඇප ලබාදීමට අධිකරණයට බලයක් නොමැති බැවින් 2022.06.09 දක්වා පැමිණිලිකරු රක්ෂිත බන්ධනාගාර ගත කර තිබේ. පසුව මෙම නඩුව 2022.06.09 දින සිට 2022.09.28 දක්වා අවස්ථා නවයකදී කැඳවා රස පරීක්ෂක වාර්තාව කැඳවීම සඳහා සිහිකැඳවීම් යොමුකර ඇත. 2022.10.05 දින රජයේ රස පරීක්ෂක වාර්තාව ගරු අධිකරණය වෙත ලැබීමෙන් අනතුරුව 2022.10.12 දින නඩුව කැඳවා රස පරීක්ෂක වාර්තාව අනුව නඩු භාණ්ඩවල බර මිලිග්‍රෑම් 850 ක් පවතින බවට පමණක් දක්වා ඒ අනුව පැමිණිලිකරුට ඇප ලබාදී ඇත.

- 2023.01.11 දින නැවත නඩුව කැඳවා ඇති අතර පැමිණිල්ලට අදාළ පළමු සාක්ෂිය වන රජයේ රස පරීක්ෂක වාර්තාව ගරු මහේස්ත්‍රාත්තුමා විසින් පරීක්ෂා කර බලා එම වාර්තාව අනුව සැකකරු සන්තකයේ තිබූ ද්‍රව්‍ය තුළ විෂ මත්ද්‍රව්‍ය අනාවරණය වීමක් නොවන බවත්, ඒ අනුව මෙම නඩුව ඉදිරියට පවත්වාගෙන යා නොහැකි බැවින් චූදිත නිදොස්කොට නිදහස් කරන බවට නියෝග කර ඇත. තවද ගරු අධිකරණය විසින් පැමිණිල්ල ඉදිරිපත් කරන ලද වරකාපොල පොලිස් ස්ථානය වෙත තරයේ අවවාද කරමින්, මින් ඉදිරියට සාක්ෂි නොමැතිව පුද්ගලයන්ට එරෙහිව නඩු පැවරීම සිදුකරනු ලබන්නේ නම් චූදිතයා වින්දිතයෙකු ලෙස සලකා වන්දි ලබාදීමට කටයුතු කරන බවට දැනුම්දෙමින් නඩු කටයුතු අවසන් කර ඇති බවට නිරීක්ෂණය වේ.

- පැමිණිලිකරු අත්අඩංගුවට ගන්නා ලද අවස්ථාවේදී ඔහුගේ ත්‍රීරෝද රථයේ තිබී සොයාගන්නා ලද හෙරොයින් බවට සැක කරන ලද පවුඩර් වර්ගයෙහි බර මිලිග්‍රෑම් 2300 ක් බව අත්අඩංගුවට ගන්නා ලද නිලධාරීන් විසින් අධිකරණයට කරුණු වාර්තා කර අතර, එකී නඩු භාණ්ඩ 2022.06.09 දිනැතිව, වර/මහේ/අධි- බී/285/22 දරණ නඩු අංක යටතේ වරකාපොල මහේස්ත්‍රාත් අධිකරණ විසින් ආණ්ඩුවේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුව වෙත යොමුකර ඇත. එහෙත් රස පරීක්ෂක දෙපාර්තමේන්තුව විසින් 2022.07.28 දිනැතිව වරකාපොල මහේස්ත්‍රාත් අධිකරණය වෙත යොමුකරන ලද වාර්තාවෙහි සඳහන් කර ඇත්තේ, ඉහත නඩු අංකයට අදාළව ඉදිරිපත් කර ඇති පවුඩර් වර්ගයේ බර මිලිග්‍රෑම් 850 ක් බවයි. ඒ අනුව පෙනී යන්නේ වරකාපොල පොලිස් ස්ථානය විසින් පැමිණිලිකරු අධිකරණයට ඉදිරිපත් කිරීමේදී හෙරොයින් බවට සැක කරන ලද පවුඩර් වර්ගයෙහි බර මිලිග්‍රෑම් 2300 ක් බව සඳහන් කර තිබූ බැවින් ඇප ලබාදීමට නොහැකිවී පැමිණිලිකරුට බන්ධනාගාර ගත වීමට සිදුවී ඇති බවයි. තවද, වගඋත්තර පාර්ශවය විසින් මෙම පවුඩර් ප්‍රමාණය කිරා මැනීම සිදුකර ඇත්තේ වරකාපොල පොලිස් ස්ථානය ඉදිරිපිට ඇති ස්වර්ණ

මහල් නැවති ස්වර්ණාභරණ වෙළඳසැලක පවතින විද්‍යුත් තරාදියකින් වේ. එසේ සිදුකිරීමට හේතුව ලෙස වගඋත්තර පාර්ශවය ප්‍රකාශ කර ඇත්තේ, වරකාපොල පොලිස් ස්ථානයේ මත්ද්‍රව්‍ය අත්අඩංගුවට ගත් පසු කිරාමැන බැලීම සඳහා අවශ්‍ය උපකරණ ස්ථානය සතුව නොමැති බැවින් මෙම වෙළඳසැල මගින් අදාළ මැන බැලීම් සිදුකරන බවයි.

- බොහෝ මත්ද්‍රව්‍ය අත්අඩංගුවට ගැනීම් වලදී අධිකරණයට ඉදිරිපත් කරන ලද අවස්ථාවේදී නඩු භාණ්ඩ ලෙස ඉදිරිපත් කරනු ලබන මත්ද්‍රව්‍ය වල සඳහන් කරන ලද බර සහ රස පරීක්ෂක වාර්තාව අනුව ශුද්ධ මත්ද්‍රව්‍ය ප්‍රමාණයෙහි බර අතර වෙනසක් දැකගත හැක. එහිදී ශුද්ධ හෙරොයින් ප්‍රමාණය කොපමණක් ද යන්න රස පරීක්ෂක වාර්තාව අනුව පැහැදිලි වන බැවින් අනෙකුත් ද්‍රව්‍ය හෙරොයින් නොවන බවට තීරණ කරනු ලබයි. එහෙත් මෙකී නඩුවේදී 2022.06.09 වන දින රජයේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුව වෙත ලබාදෙන ලද නඩු භාණ්ඩ පාර්සලයේ බර මිලිග්‍රෑම් 850 ක් බව 2022.07.28 දිනැතිව ආණ්ඩුවේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුව විසින් යොමු අංක N/7875/2022(CD/7875/2022 දරණ වාර්තාවෙහි සඳහන් කර ඇත. (The paper packet contained a brown coloured powder. The weight of the brown coloured powder was 850 milligrams(0.850 grams).

- තවද, මෙම දුඹුරු පැහැති පවුඩර් වර්ගයේ කිසිදු විෂ මත්ද්‍රව්‍යයක් පවතින බවට හඳුනාගත නොහැකි බවට 2022.07.28 දිනැතිව වරකාපොළ මහේස්ත්‍රාත් අධිකරණය වෙත යොමුකරන ලද ආණ්ඩුවේ රස පරීක්ෂක වාර්තාවෙහි සඳහන් කර ඇත. (Heron, Morpine or any other dangerous drugs specified in the "Poison, Opium and Dangerous Drugs Ordinance" were not identified in the brown coloured poweder in the paper packet). මෙකී රස පරීක්ෂක වාර්තාව අනුව පැහැදිලි වන්නේ, මෙම පැකට්ටුවේ තිබූ සම්පූර්ණ ද්‍රව්‍යවල ශුද්ධ බර මිලිග්‍රෑම් 850 ක් වන බවයි. යම්හෙයකින් පැකැට්ටුවේ තිබූ ද්‍රව්‍යවල සම්පූර්ණ බර මිලිග්‍රෑම් 2300 ක ලෙස සටහන් කොට ශුද්ධ හෙරොයින් බර මිලිග්‍රෑම් 850 ක් බවට වාර්තා කර තිබුණේ නම් වගඋත්තර පාර්ශවය විසින් වාර්තා කරන ලද තොරතුරු අනුව අදාළ පවුඩර් වර්ගයේ බර සත්‍ය බවට පිළිගත හැකිවනු ඇත. එහෙත් වරකාපොල පොලිස් ස්ථානය විසින් මුල් අවස්ථාවේදීම අධිකරණය වෙත මිලිග්‍රෑම් 2300 ක් බරැති හොරොයින් සන්තකයේ තිබූ බවට සාවද්‍ය තොරතුරු වාර්තා කර තිබීම හේතුවෙන් පැමිණිලිකරුට ඇප ලබාගැනීමට නොහැකිවී ඇති බවත් ඒ හේතුවෙන් බන්ධනාගාර ගතවීමට සිදුවූ බවත් නිරීක්ෂණය වේ.

- එමෙන්ම මෙම පැමිණිල්ලට අදාළ වැටලීම සහ අත්අඩංගුවට ගැනීම සිදුකරන ලද වරකාපොල පොලිස් ස්ථානයේ නිලධාරීන් වන, උප පොලිස් පරීක්ෂක කේ. පී. කේ. රණවංශ මහතා පොලිස් සේවයේ වසර 30 ක පළපුරුද්දක් සහ මත්ද්‍රව්‍ය වැටලීම සම්බන්ධ වසර 03 පළපුරුද්දක් සහිත නිලධාරියෙක් වන අතර පොලිස් සැරයන්53529 ඒ. කේ. කලුආරච්චි නිලධාරියා විශේෂ කාර්ය බලකායේ වසර 16 ක් සහ සාමාන්‍ය පොලිස් රාජකාරී සේවාවේ වසර 16 ක පලපුරුද්ද සහිත මත්ද්‍රව්‍ය වැටලීම් ගණනාවක් සිදුකරන ලද නිලධාරියෙක් බව කොමිෂන් සභාව වෙත ප්‍රකාශකර

ඇත. මෙකී පැමිණිල්ලට අදාළ වැටලීම සිදුකරන අවස්ථාවේදී පැමිණිලිකරුගේ ත්‍රීරෝද රථයේ තිබී හමුවූ සිගරට් පැකට්ටුව තුළ බහාලන ලද රෝස පැහැති කුඩා පාර්සල්වල ඔතන ලද ද්‍රව්‍ය හෙරොයින් බවට මෙම නිලධාරීන් විසින් හඳුනාගෙන තිබේ. එසේ හඳුනාගැනීමට මත්ද්‍රව්‍ය වැටලීම් තුළින් ලද අත්දැකීම් හේතුවූ බව එම නිලධාරීන් ප්‍රකාශ කර තිබේ.

- තවද පැමිණිලිකරු විසින් ප්‍රකාශ කර ඇති පරිදි, පැමිණිලිකරුගේ ත්‍රීරෝද රථයේ තිබී සොයාගන්නා ලද පවුඩර් වර්ගය උප පොලිස් පරීක්ෂක කේ. පී. කේ. රණවංශ නිලධාරියා විසින් පරීක්ෂා කර "මේ තියෙන්නේ බඩු" යැයි ප්‍රකාශ කර ඇත. එමෙන්ම පැමිණිලිකරු විසින් ප්‍රකාශ කර ඇති පරිදි, පොලිස් සැරයන් 53529 ඒ. කේ. කලුආරච්චි නිලධාරියා විසින් ද "මේ අහුවෙලා තියෙන්නේ සුපිරි බඩු, මෙච්චර හොඳ බඩු ටිකක් මම කවදාවත් අල්ලලා නැහැ" යනුවෙන් පැවසූ බව පැමිණිලිකරු සඳහන් කර ඇත. ඒ අනුව වසර ගණනක මත්ද්‍රව්‍ය වැටලීම් පිළිබඳ පළපුරුද්ද සහිත මෙම නිලධාරීන්ට පැමිණිලිකරු සන්තකයේ තිබූ පවුඩර් වර්ගය හෙරොයින් නොවන බවට හඳුනාගත නොහැකිවීම ගැටලු සහගත වේ. එමෙන්ම එම නිලධාරීන් ප්‍රකාශ කළ ආකාරයට මත්ද්‍රව්‍ය වැටලීම් රාජකාරී කාලය තුළ මෙවැනි සිදුවීමක් සිදුවූ පළමු අවස්ථාව මෙය වේ. එසේ නම් එම නිලධාරීන්ට මෙම ද්‍රව්‍ය නිවැරදිව හඳුනාගැනීමට නොහැකි වූයේ ඇයිද යන්න ගැටලු සහගත වේ.

- ඒ අනුව මෙම පැමිණිල්ලට අදාළ වැටලීම් රාජකාරී වලදී උප පොලිස් පරීක්ෂක රණවංශ නිලධාරියා සහ පොලිස් සැරයන් 53529 ඒ. කේ. කලුආරච්චි නිලධාරියා සිය රාජකාරී කටයුතු නිසි විමර්ශනයකින් තොරව සිදුකර ඇති බවට කොමිෂන් සභාවට නිරීක්ෂණය වේ. තවද, අත්අඩංගුවට ගන්නා ලද පවුඩර් වර්ගය හඳුනාගැනීම සහ මැන බැලීම යන අවස්ථා දෙකේදීම එම නිලධාරීන් අත්තනෝමතික ආකාරයෙන් කටයුතු කර ඇති බව පෙනීයයි. එම නිලධාරීන්ගේ මෙම ක්‍රියාකලාපය හේතුවෙන් පැමිණිලිකරුට වැරදිකරුවෙකු ලෙස මාස 04 යි දින 28 ක පමණ කාලයක් රක්ෂිත බන්ධනාගාර ගතවීමට සිදුව ඇති බව නිරීක්ෂණය වේ.

- පැමිණිලිකරු අත්අඩංගුවට ගත් පසු ගරු අධිකරණයට කරුණු වාර්තා කිරීම සිදුකර ඇත්තේ ස්ථානයේ ස්ථානාධිපති විසින් නොවන අතර, පැමිණිලිකරු අත්අඩංගුවට ගැනීම සම්බන්ධයෙන් අදාළ තොරතුරු සටහන් පොත්වල ඇතුළත් කරන ලද තොරතුරු වලට අනුව ප්‍රධාන පොලිස් පරීක්ෂක ඒ. ඩී. සී. ප්‍රසාද් නිලධාරියා විසින් බී වාර්තාවක් මගින් ගරු අධිකරණයට කරුණු වාර්තා කර ඇති බව නිරීක්ෂණය වේ.

- එමෙන්ම තෙවන වගඋත්තරකරු ප්‍රධාන පොලිස් පරීක්ෂක එස්. ජී. ඒ. ආර්. එල්. සේනාධීර මයා - ස්ථානාධිපති (හිටපු), (වරකාපොළ පොලිස් ස්ථානය) ප්‍රකාශ කර ඇති පරිදි, පැමිණිලිකරු සම්බන්ධයෙන් වරකාපොළ පොලිස් ස්ථානයේ පොලිස් පරීක්ෂක අබේරත්න නිලධාරියා විසින් වැඩිදුර විමර්ශනය කර ලබාදුන් තොරතුරු අනුව, එම අය විසින් 2022.06.09 වන දින ගරු

අධිකරණයට වැඩිදුර වාර්තාවක් යොමුකර ඇති අතර, ප්‍රධාන පොලිස් පරීක්ෂක එස්. ජී. ඒ. ආර්. එල්. සේනාධීර මයා 2022.07.29 වන දින ස්ථානමාරුවීම් ලබා ගොස් ඇති බව නිරීක්ෂණය වේ.

- කෙසේනමුත් තෙවන වගඋත්තරකරු වන ප්‍රධාන පොලිස් පරීක්ෂක එස්.ජී.ඒ.ආර්.එල්. සේනාධීර මහතා (හිටපු ස්ථානාධිපති) පොලිස් ස්ථානයේ ස්ථානාධිපති වශයෙන් සිය පොලිස් ස්ථානයට 2022.05.21 වන දින මත්ද්‍රව්‍ය සන්තකයේ තබාගැනීමක් සම්බන්ධයෙන් 119 ක්ෂණික ඇමතුම් ඒකකය මගින් ලද තොරතුර සම්බන්ධයෙන් එදින ක්‍රියාත්මක නොවී, ඊට දින පහකට පමණ පසු අදාළ ස්ථානයට නිලධාරීන් යොමු කිරීම මගින් සහ, එකී තොරතුරු 2022.05.25 වන දින ලද බවට සාවද්‍ය කරුණු ඉදිරිපත් කිරීම තුළින්, එම නිලධාරියා සිය අධීක්ෂණ වගකීම නිසි පරිදි ඉටුකර නොමැති බවත්, සිය අභිමතය පරිදි කටුයුතු කර ඇති බවත් මානව හිමිකම් කොමිෂන් සභාවට නිරීක්ෂණය වේ.

නිගමනය :

පැමිණිලි පාර්ශවය විසින් සහ වගඋත්තර පාර්ශවය විසින් යොමුකරන ලද සියලු කරුණු සලකා බැලීමේදී, රජයේ රස පරීක්ෂක වාර්තාව අනුව පැමිණිලිකරුගේ ත්‍රීරෝද රථයේ තිබී සොයාගන්නා ලද ද්‍රව්‍ය තුළ කිසිදු මත්ද්‍රව්‍ය වර්ගයක් අන්තර්ගතව තිබී නොමැති පසුබිමක සහ පැමිණිලිකරුගේ ත්‍රීරෝද රථයේ මත්ද්‍රව්‍ය සඟවා ඇති බවට පණිවිඩය ලැබී දින පහට පමණ පසු සිදුකරන ලද සෝදිසි කිරීමකින් පසු මෙකී අත්අඩංගුවට ගැනීම සිදුකර තිබීම තුළින් පෙනීයන්නේ, පළමුවන, දෙවන සහ තුන්වන වගඋත්තරකරුවන් විසින් නීතියෙන් නියම කරනු ලැබූ කාර්යය පටිපාටියට අනුකූලව විධිමත් විමර්ශනයක් සිදුනොකර අත්තනෝමතික ආකාරයෙන් කටයුතු කර පැමිණිලිකරු අත්අඩංගුවට ගැනීම හේතුවෙන්, **පැමිණිලිකාර පාර්ශවය සම්බන්ධයෙන්, 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ III වන පරිච්ඡේදයේ 13 (1) වන ව්‍යවස්ථාව මගින් සහතික කොට ඇති "නීතියේ නියම කරනු ලැබූ කාර්යය පටිපාටියට අනුකූලව මිස කිසිම තැනැත්තෙකු සිරභාරයට ගැනීම නොකළ යුතතේය" යන මූලික අයිතිවාසිකම පළමුවන වගඋත්තරකරු වන උප පොලිස් පරීක්ෂක කේ.පී.කේ. රණවංශ නිලධාරියා සහ දෙවන වගඋත්තරකරු වන පොලිස් සැරයන් 53529 ඒ.කේ. කලුආරච්චි යන නිලධාරීන් විසින් උල්ලංඝනය කර ඇති බවට කොමිෂන් සභාව විසින් මෙයින් නිගමනය කරනු ලැබේ.**

**අත්අඩංගුවට ගැනීමේදී නීතිය ප්‍රකාරව සිදු කළ යුතු නිසි විමර්ශනයක් සිදු කිරීමකින් තොරව පැමිණිලිකරු අත්අඩංගුවට ගැනීම මගින් පැමිණිලිකාර පාර්ශවය සම්බන්ධයෙන්, 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මූලික අයිතිවාසිකම් පරිච්ඡේදයේ 12 (1) ව්‍යවස්ථාව මගින් තහවුරු කර ඇති "නීතිය පසිදලීම සහ ක්‍රියාත්මක කිරීම ද නීතියේ රැකවරණය ද සර්ව සාධාරණ විය යුත්තේය" යන මූලික අයිතිවාසිකම පළමුවන වගඋත්තරකරු වන උප පොලිස් පරීක්ෂක කේ. පී. කේ. රණවංශ නිලධාරියා සහ දෙවන වගඋත්තරකරු වන පොලිස් සැරයන් 53529 ඒ. කේ. කලුආරච්චි යන**

නිලධාරීන් විසින් උල්ලංඝනය කර ඇති බවට කොමිෂන් සභාව විසින් මෙයින් නිගමනය කරනු ලැබේ.

තවද, වරකාපොල පොලිස් ස්ථානයේ ස්ථානාධිපති ලෙස සේවය කළ තෙවන වගඋත්තරකරු ප්‍රධාන පොලිස් පරීක්ෂක එස්.ජී.ඒ.ආර්.එල්. සේනාධීර නිලධාරියා විසින්, තම අධීක්ෂණ වගකීම නිසි ලෙස ඉටු නොකිරීමත්, අත්අඩංගුවට ගත් තැනැත්තකු සම්බන්ධයෙන් නීතිය හා පරිපාටි ප්‍රකාරව නිසි අවධානයකින් යුතුව ක්‍රියානොකිරීම හේතුවෙන්, 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මූලික අයිතිවාසිකම් පරිච්ඡේදයේ 12 (1) ව්‍යවස්ථාව මඟින් තහවුරු කර ඇති "නීතිය පසිදලීම සහ ක්‍රියාත්මක කිරීම ද නීතියේ රැකවරණය ද සර්ව සාධාරණ විය යුත්තේය" යන පුරවැසියෙකු සතු මූලික අයිතිවාසිකම පැමිණිලිකරු සම්බන්ධයෙන් උල්ලංඝනය කර ඇති බවට නිගමනය කරනු ලැබේ.

ඉහත නිගමන අනුව 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මූලික අයිතිවාසිකම් පරිච්ඡේදයේ 12 (1) ව්‍යවස්ථාව සහ 13 (1) ව්‍යවස්ථාව පළමු, දෙවන සහ තෙවන වගඋත්තරකරුවන් විසින් උල්ලංඝනය කිරීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් පහත දැක්වෙන නිර්දේශ නිකුත් කරනු ලැබේ.

<u>නිර්දේශය :</u>

1) පළමු වගඋත්තරකරුවන උප පොලිස් පරීක්ෂක කේ.පී.කේ. රණවංශ නිලධාරියා විසින් රු. 500,000/- මුදලක් පැමිණිලිකරු වෙත ගෙවිය යුතුය.
2) දෙවන වගඋත්තරකරුවන පොලිස් සැරයන් 53529 ඒ. කේ. කලුආරච්චි නිලධාරියා විසින් විසින් රු. 500,000/- මුදලක් පැමිණිලිකරු වෙත ගෙවිය යුතුය.
3) තුන්වන වගඋත්තරකරුවන ප්‍රධාන පොලිස් පරීක්ෂක එස්.ජී.ඒ.ආර්.එල්. සේනාධීර නිලධාරියා විසින් රු. 50,000/- ක මුදලක් පැමිණිලිකරු වෙත ගෙවිය යුතුය.

<u>පොලිස්පතිවරයා විසින්,</u>

4) පළමු වනගඋත්තරකරුවන උප පොලිස් පරීක්ෂක කේ.පී.කේ. රණවංශ නිලධාරියා, දෙවන වගඋත්තරකරුවන පොලිස් සැරයන් 53529 ඒ. කේ. කලුආරච්චි නිලධාරියා සහ තුන්වන වගඋත්තරකරුවන ප්‍රධාන පොලිස් පරීක්ෂක එස්. ජී. ඒ. ආර්. එල්. සේනාධීර නිලධාරියා සම්බන්ධයෙන් පරීක්ෂණයක් පවත්වා සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය. එසේ ගනු ලබන ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් කොමිෂන් සභාව දැනුම්වත් කළ යුතුය.

2026. 06. 02...... වන දිනට පෙර මෙකී නිර්දේශ ක්‍රියාත්මක කර ඒ සම්බන්ධයෙන් වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15(7) වන වගන්ති ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේම, එකී නිර්දේශ ක්‍රියාත්මක කර ඉදිරිපත් කිරීමට නියමිත දින සිට සතියක කාලයක් තුළ මෙම නිර්දේශ ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකාර පාර්ශවය විසින් ද කොමිෂන් සභාවට දැනුම් දිය යුතුය.

| | |
|---|---|
| එල්.ටී.බී. දෙහිදෙණිය,<br>ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (හිටපු)<br>සභාපති. | නිමල් ජී. පුංචිහේවා,<br>කොමසාරිස්,<br>ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව. |
| විනිසුරු එල්.ටී.බී.දෙහිදෙණිය<br>ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (විශ්‍රාමික)<br>සභාපති<br>ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව | නිමල් ජී. පුංචිහේවා<br>ජ්‍යෙෂ්ඨ නීතිඥ<br>කොමසාරිස් |

පිටපත :-

01. අමාත්‍යතුමා,
මහජන ආරක්ෂක අමාත්‍යාංශය,
04 වන මහල, සුහුරුපාය, බත්තරමුල්ල.

02. ලේකම්,
මහජන ආරක්ෂක අමාත්‍යාංශය,
04 වන මහල, සුහුරුපාය, බත්තරමුල්ල. - ඉහත නිර්දේශ ප්‍රකාරව පියවර ගැනීමට.

03. පොලිස්පති,
පොලිස් මූලස්ථානය, කොළඹ 01. - ඉහත නිර්දේශ ප්‍රකාරව පි.ගැ.

04. සභාපති,
ජාතික පොලිස් කොමිෂන් සභාව,
අංක 09 ගොඩනැගිල්ල, BMICH පරිශ්‍රය,
බෞද්ධාලෝක මාවත, කොළඹ 07. - අ.ක.ස.

05. අධ්‍යක්ෂ,
මානව හිමිකම් කොට්ඨාශය,
එන්. එම්. පෙරේරා මාවත,
කොටා ටෙරසය, කොළඹ 08. - අ.ක.ස.

සැ.යු. - අදාළ මුදල "මුදල් ඇණවුමක්" මගින් පැමිණිලිකරු වෙත ගෙවා එහි පිටපතක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන්න.